ව්‍යාපාර කළමනාකරණවේද (සාමාන්‍ය) උපාධි

ප්‍රථම වර්ෂ පරීක්ෂණය (බාහිර) - 2007

**BMGT E 1025 – ව්‍යාපාර ගිණුම්කරණය**

ප්‍රශ්න සංඛ්‍යාව : 05 කාලය : පැය 03 යි

**සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

(01) ශ්‍රී ලංකා ගිණුම් ප්‍රමිත පිළිබඳ ඔබගේ දැනුම පදනම් කරගෙන පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේදී සමස්ථයක් ලෙස සැලකිය යුතු කරුණුද, ඒවායේ ව්‍යුහය සඳහා මගපෙන්වීම් සහ මූල්‍ය ප්‍රකාශන තුළ අන්තර්ගත විය යුතු අවම අවශ්‍යතාද ශ්‍රී ලංකා ගිණුම් ප්‍රමිත අංක 03 මගින් නිර්දේශ කරනු ලබයි. මෙම ප්‍රමිතයට අනුව;

i) ගිණුම් ප්‍රකාශන ඉදිරිපත් කිරීමේදී පදනම් කරගත යුතු සංකල්ප පැහැදිලි කරන්න.

ii) ආදායම් ප්‍රකාශනයේ මුහුණතෙහි ඉදිරිපත් කළ යුතු තොරතුරු මොනවාද?

iii) වත්කම් සහ බැරකම් වර්ගීකරණ කරන්නේ කෙසේද?

(ලකුණු 06)

(ආ) ශ්‍රී ලංකා ගිණුම් ප්‍රමිත අංක (09) (මුදල් ප්‍රවාහ ප්‍රකාශන) අනුව ව්‍යාපාරයක් විසින් මුදල් ප්‍රවාහ ප්‍රකාශනයක් පිළියෙල කළ යුතුය.

(i) මුදල් ප්‍රවාහ ප්‍රකාශනයක අරමුණ කුමක්ද?

(ii) මුදල් ප්‍රවාහ ප්‍රකාශනයක ප්‍රයෝජන මොනවාද?

(ලකුණු 04)

(ඇ) (i) ශ්‍රී.ල.ගි.ප්‍ර. අංක 10 අනුව ගිණුම්කරණ ප්‍රතිපත්ති තෝරාගැනීම සහ වෙනස්කිරීම සම්බන්ධ තීරණායක පැහැදිලි කරයි. මේ අනුව ආයතනයකට ගිණුම් ප්‍රතිපත්තීන් වෙනස්කළ හැකි අවස්ථා 02 ක දක්වන්න.

(ලකුණු 02)

(ඈ) "ශේෂපත්‍ර දිනට පසුව හටගන්නා සිදුවීම්" යන්න නිර්වචනය කර, මෙම සිදුවීම්වලට අදාල හෙළිදරව් කිරීමේ අවශ්‍යතා මොනවාද යන්න දක්වන්න.

(ලකුණු 03)

(මුළු ලකුණු 15)

(02) (අ) සංඛ සමාගම විසින් 2006 වර්ෂය තුළ දී විකුණන ලද භාණ්ඩ සමහරක් 2006 දෙසැම්බර් 31 දිනට වූ තොගයෙහි වැරදි ලෙස රු. 13,000/- ක් වශයෙන් ඇතුලත් කර තිබූ බව 2007 වර්ෂයේදී අනාවරණය විය. පහත තොරතුරු ඔබට සපයා ඇත.

| | 2007.12.31 | 2006.12.31 |
|---|---|---|
| විකුණුම් | 208,000 | 147,000 |
| විකුණුම් බඩුවල පිරිවැය | 173,000 | 107,000 |
| ආදායම් බදු | 10,500 | 12,000 |

2006 සහ 2007 වර්ෂ සඳහා සංඛ සමාගමේ ආදායම්බදු අනුපාතිකය 30% ක් වූ අතර වෙනත් ආදායම් හෝ වියදම් කිසිවක් නොවීය. සංඛ සමාගම දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය වාර්තා පිළියෙල කරනු ලබයි.
ඉහත සඳහන් වරද 2007 වර්ෂයේදී නිවැරදි කරන ආකාරය දක්වා ලාභයේ ඇතිවූ වෙනස පෙන්වන්න.

(ලකුණු 06)

(ආ) සීමාසහිත අචලා සමාගමේ 2007.03.31 දිනට තොගය පිරිවැයට රු. 550,000/- ක් විය. මෙම තොගය සම්පූර්ණයෙන් 2007.04.18 වන දින ඇති වූ ගින්නකින් විනාශ විය. තොග ගිනි හානිය පිළිබඳ සමාගම රක්ෂණ ආවරණයක් ලබාගෙන නොතිබිණි. සමාගමේ 2007.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද්දේ 2007.06.28 දිනයි.

මෙම සිද්ධිය 2007.03.31 දිනට සකස් කරන ලද මූල්‍ය ප්‍රකාශන වල දක්වන්නේ ද? ඔබේ පිළිතුර සනාථ කිරීම සඳහා හේතු දක්වන්න. මේ සඳහා අදාල කරගත යුතු ශ්‍රී ලංකා ගිණුම් ප්‍රමිතය කුමක්ද?

(03) (i) අමල්, නිමල් කමල් යන තිදෙනා හවුල් ව්‍යාපාරයක් පවත්වා ගෙන ගිය අතර 2007 දෙසැම්බර් 31 දිනට ඔවුන්ගේ හවුල් ව්‍යාපාරයේ ශේෂ පිරික්සුම පහත පරිදි වේ.

| | හර | බැර |
|---|---|---|
| හවුල්කරුවන්ගේ ප්‍රාග්ධන ගිණුම් (2007.01.01) | | |
| අමල් | | 150,000 |
| කමල් | | 100,000 |
| නිමල් | | 50,000 |
| හවුල්කරුවන්ගේ ජංගම ගිණුම (2007.01.01) | | |
| අමල් | | 3,000 |
| නිමල් | 6,000 | |
| කමල් | | 1,500 |
| විකුණුම් | | 1,200,000 |
| ගෙනඒමේ කුලී | 12,000 | |
| බැංකු මුදල් | 7,200 | |
| දුන් වට්ටම්/ ලද වට්ටම් | 22,800 | 12,900 |
| ගැනිලි | | |
| අමල් | 75,000 | |
| නිමල් | 66,000 | |
| කමල් | 45,000 | |
| වැටුප් හා වේතන | 55,500 | |
| පරිපාලන වියදම් | 81,000 | |
| මෝටර් රථ (පිරිවැය) | 240,000 | |
| මෝටර් රථ සඳහා ක්ෂය වෙන්කිරීම් (2007.01.01) | | 60,000 |
| යන්ත්‍ර උපකරණ (පිරිවැය) | 300,000 | |
| යන්ත්‍ර උපකරණ ක්ෂය වෙන්කිරීම් (2007.01.01) | | 90,000 |
| අඩමාණ ණය සඳහා වෙන්කිරීම් (2007.01.01) | | 1,500 |
| ගැනුම් | 700,000 | |
| තොගය (2007.01.01) | 90,000 | |
| වෙළඳ ණය හිමියෝ | | 67,600 |
| වෙළඳ ණය ගැතියෝ | 36,000 | |
| | **1,736,500** | **1,736,500** |

අමල්, නිමල්, කමල්ගේ හවුල් ගිවිසුමේ පහත කොන්දේසි ඇතුලත්ය.

(1) ලාභාලාභ 4:3:1 යන අනුපාතයට පිලිවෙලින් අමල්, නිමල්, කමල් අතර බෙදිය යුතුය.

(2) වර්පය ආරම්භයේ ඇති ප්‍රාග්ධන ශේපයන් මත 10% වාර්පික පොලියක් හවුල්කරුවන්ට හිමිවිය

(3) ගැනිලි මත 5% ක වාර්පික පොලියක් අයකරයි.

(4) හවුල් ව්‍යාපාරයේ කළමනාකරුවකු වශයෙන් ක්‍රියාකරන අමල්ට මසකට රු. 5000 බැගින් වූ වේතනයක් ලබාදෙයි.

පහත අතිරේක තොරතුරු සපයා ඇත.

(i) 2007 දෙසැම්බර් 31 දිනට වසර අවසන් තොගය රු. 120,000 ක් ලෙස අගය කරන ලදී.

(ii) මෝටර් රථ සඳහා පිරිවැය මත 20% ක් ද යන්ත්‍ර උපකරණ පිරිවැයට 10% ක් ද වාර්පික ක්ෂය සඳහා වෙන්කළ යුතුය.

(iii) ණයගැතියන්ගෙන් රු. 1200 ක ණය මුදලක් කපා හැරිය යුතු අතර, ඉතිරි ණය ගැතියන්ගෙන් 5% වන සේ අඩමාණ ණය වෙන්කිරීම් කළ යුතුය.

(iv) අමල්ට ගෙවන ලද වේතන රු. 20,000 ක් වැටුප් හා වේතන ගිණුමේ ඇතුලත්ව ඇත.

(v) වර්පය තුලදී රු. 10,000 ක් පිරිවැය වූ භාණ්ඩ තොගයක් නිමල් ඔහුගේ පෞද්ගලික ප්‍රයෝජනයට යොදා ගෙන ඇති අතර මෙම ගණුදෙනුවට අදාල කිසිම සටහනක් හවුල් ව්‍යාපාරයේ පොත්වල ඇතුලත් කර නොමැත.

පහත සඳහන් දෑ පිළියෙල කරන්න.

(අ) 2007 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්පය සඳහා වෙළෙඳ හා ලා/ලා ගිණුම සහ ලා/ලා විසර්ජන ගිණුම.

(ආ) 2007 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්පය සඳහා තීරු ක්‍රමයට හවුල්කරුවන්ගේ ජංගම ගිණුම.

(ඇ) 2007 දෙසැම්බර් 31 දිනට හවුල් ව්‍යාපාරයේ ශේෂ පත්‍රය.

(ii) 2008 ජනවාරි 01 වන දින අමල් තිමල් හා කමල් ඔවුන්ගේ හවුල් ව්‍යාපාරය සීමිත ආසිරි සමාගමට පහත කොන්දේසි මත විකිණීමට එකග වූහ.

i) ආසිරි සමාගම යන්ත්‍ර හා උපකරණ රු. 175,000 කට හා මෝටර් රථ වලින් කොටසක් රු. 115,000/- කට පවරා ගැනීමට එකග විය. හවුල් ව්‍යාපාරයේ ඉතිරි වූ මෝටර් රථය අමල් විසින් රු. 20,000 කට පවරා ගන්නා ලදී.

ii) ආසිරි සමාගම තොගය රු. 130,000 කට පවරා ගත් අතර වෙළඳ ණය ගැතියන් පවරා නොගත්තා ලදී. ණය ගැතියන්ගෙන් රු. 20,800 එකතු කරගත් අතර ඉතිරි හේපය තිමල් විසින් පවරා ගන්නා ලදී.

iii) වෙළෙඳ ණය හිමියන් සඳහා රු. 65,000 ක් හවුල් ව්‍යාපාරය විසින් ගෙවන ලදී.

iv) 2008.01.01. දින ගැණුම් ප්‍රතිශ්ඨාව සම්පූර්ණයෙන් නිදහස් කිරීමට ආසිරි සමාගම විසින් එකක් රු. 10/ සාමාන්‍ය කොටස් 30,000 ක් සම මිලට නිකුත් කිරීමට එකග වූ අතර රු. 200,000/- ක් මුදලින් ගෙවන ලදී. සාමාන්‍ය කොටස් හවුල්කරුවන් අතර සමානව බෙදාහරින ලදී. මෙදිනම මුදල් හුවමාරුව මගින් හවුල් ව්‍යාපාරයේ පොත් පියවන ලදී.

පහත දෑ පිළියෙල කරන්න.

(අ) හවුල් ව්‍යාපාරයේ උපලබ්ධි ගිණුම

(ආ) හවුල් ව්‍යාපාරයේ බැංකු ගිණුම

(ඉ) 2008.01.01 දිනට හවුල්කරුවන්ගේ ප්‍රාග්ධන ගිණුම (තීරු ක්‍රමයට)

(ලකුණු 15)

(මුළු ලකුණු 35)

(04) (i) 1982 අංක 17 දරන සමාගම් පනත හා 2007 අංක 07 දරන සමාගම් පනත අතර වෙනස්කම් දක්නට ලැබේ. 2007 අංක 07 දරන සමාගම් පනතට අනුව, සමාගමක සාමාජික සංඛ්‍යාව, කොටස් ප්‍රාග්ධනය සහ සමාගමක කොටස් සම්බන්ධව ඇතිකරන ලද මූලික වෙනස්කම් කවරේද?

(ලකුණු 05)

(ii) සීමිත අනුලා සමාගම 2007 ජනවාරි මස 01 වන දින රු. 40/- බැගින් සාමාන්‍ය කොටස් 50000 ක් නිකුත් කරන ලදී. මුදල් ගෙවිය යුතු ආකාරය පහත පරිදි වේ.

| | රු. |
|---|---|
| අයදුමේදී | 12 |
| විභජන මුදල් | 14 |
| පළමු ඇරයුම් මුදල් | 14 |
| | 40 |

සමාගමට කොටස් 90,000 ක් සඳහා අයදුම්පත් ලැබුණු අතර ඉන් කොටස් 20,000 ක් සඳහා වූ අයදුම්පත් ප්‍රතික්ෂේප කර මුදල් ආපසු යවන ලදී. කොටස් 20,000 ක් අයදුම්කර තිබූ ආයතනයේ සේවකයින්ට එම කොටස් මුළුමනින්ම විභජනය කලේය. ඉතිරි අයදුම්කරුවන්ට සමානුපාතික පදනමට කොටස් විභජනය කරන ලදී. කොටස් 3,000 ක් අයදුම්කළ සේවකයෙක් නොවන අයදුම්කරුවෙකු විභජන මුදල් හා අයදුම් මුදල් ගෙවීම පැහැරහැර ඇත. අනෙකුත් සියලුම අයදුම්කරුවන් තිසි පරිදි මුදල් ගෙවා ඇත. 2007.05.31 දින මෙම කොටස් අහිමි කිරීමට තීරණය කර ඇත. 2007.06.15 දින මෙම අහිමිකළ කොටස් එකක් රු. 30/- බැගින් සම්පූර්ණයෙන් ගෙවා නිමි කොටස් වශයෙන් නැවත නිකුත් කලේය.

(අ) ඉහත ගණුදෙනු වලට අදාළ ජ'නල සටහන් දක්වන්න.

(ආ) මෙම ගණුදෙනු අනුලා සමාගමේ ශේෂපත්‍රයේ දැක්වෙන ආකාරය පෙන්නුම් කරන්න.

(ලකුණු 10)

(මුළු ලකුණු 15)

(05) සීමාසහිත කැළණි සමාගමේ 2008.03.31 දිනට පිළියෙල කළ ශේෂ පිරික්සුම පහත දැක්වේ.

| | හර | බැර |
|---|---|---|
| | . '000 | . '000 |
| 01.04.2007 දිනට සාමාන්‍ය කොටස් (කොටස් 500,000) | | 5000 |
| 01.042007 දිනට තොග | 400 | |
| වැටුප් හා වේතන | 680 | |
| විකුණුම් | | 17300 |
| විකුණුම් ආපසු එවුම් | 240 | |
| ගැණුම් | 8200 | |
| | | 120 |

| | | |
|---|---|---|
| වරිපනම් | 80 | |
| විදුලිය | 440 | |
| කාර්යාල වියදම් | 350 | |
| විකිණීමේ හා බෙදාහැරීමේ වියදම් | 420 | |
| බැංකු මුදල් | 128 | |
| බොල්ණය | 125 | |
| 2007.04.01 දිනට අඩමාණ ණය ප්‍රතිපාදන | | 50 |
| අධ්‍යක්ෂ ගාස්තු | 600 | |
| විගණන ගාස්තු | 120 | |
| ගෙන ඒමේ කුලී | 260 | |
| දුන් වට්ටම් / ලද වට්ටම් | 60 | 20 |
| 12% ණයකර 2007.04.01 දිනට ගෙවන ලද ණයකර පොලී | | 2000 |
| ගෙවන ලද ණයකර පොලී | 181 | |
| ගෙවන ලද ආදායම් බදු | 280 | |
| 2006/07 වර්ෂය සඳහා ආදායම් බදු ප්‍රතිපාදන | | 120 |
| දේපල පිරියත හා උපකරණ පිරිවැයට හා ක්ෂය 2007.04.01 | | |
| ඉඩම් | 5000 | |
| ගොඩනැගිලි | 3800 | 320 |
| මෝටර් රථ | 3600 | 900 |
| ගෘහ භාණ්ඩ හා උපකරණ | 1800 | 360 |
| ගෙවන ලද අතුරු ලාභාංශ සාමාන්‍ය කොටස් (ශුද්ධ) | 306 | |
| රඳවාගත් ලාභය | | 430 |
| පොදු සංචිත | | 1100 |
| | **28220** | **28220** |

පහත සඳහන් අමතර තොරතුරු සපයා ඇත.

1) 2008 මාර්තු 31 දිනට තොගය පිරිවැයට 340,000

2) 2008.03.31 දිනට උපචිත වරිපනම් රු. 20,000/- ක් වූ අතර ඉදිරියට ගෙවූ විදුලිය රු. 30,000/ -

3) 2004.09.01 දින රු. 800,000 කට මිලට ගත් මෝටර් රථය 2007.08.30 දින විකිණීමෙන් ලැබුණු රු. 500,000 ක මුදල විකුණුම් ගිණුමට බැර කර ඇත. ස්ථාවර වත්කම් මිලට ගත්තා වර්ෂයට අදාලව සම්පූර්ණ ක්ෂය ගණනය කරන අතර විකුණන වර්ෂයට අදාලව ක්ෂය ගණනය නොකෙරේ.

4) දේපල පිරියත හා උපකරණ සරල මාර්ග ක්‍රමයට වාර්ෂිකව ක්ෂය කල යුතු වේ.

ක්ෂය අනුපාතයන් පහත පරිදි වේ.

| | |
|---|---|
| ගොඩනැගිලි පිරිවැයෙන් | 5% |
| මෝටර් රථ පිරිවැයෙන් | 20% |
| ගෘහ භාණ්ඩ හා උපකරණ පිරිවැයෙන් | 10% |

5) වර්ෂයේදී ගෙවන ලද ආදායම් බදුවලට 2006/2007 වර්ෂය සඳහා අවසාන ගෙවීම් වශයෙන් ගෙවන ලද රු. 80,000/- ඇතුලත්ය. ඉතිරියෙන් පෙන්නුම් කරන්නේ ප්‍රවර්තන වර්ෂය සඳහා ගෙවූ ආදායම් බදුය. ප්‍රවර්තන වර්ෂය සඳහා ආදායම් බදු වගකීම රු. 1,200,000 ක් සේ ඇස්තමේන්තු කර ඇත.

6) ගෙවූ අතුරු ලාභාංශ නිරූපනය කරන්නේ 10% ක ලාභාංශ බද්ද අඩුකර ගෙවන ලද ශුද්ධ ලාභාංශයයි.

7) රු. 30,000/- ණය ගැතියෙකුගේ ශේෂයක් බොල් ණය වශයෙන් කපා හැරිය යුතු අතර ණය ගැතියන්ගෙන් 5% අඩමාණය ණය සඳහා වෙන්කිරීම් කල යුතුය.

8) සමාගමට එරෙහිව සැපයුම්කරුවකු විසින් රු. 1,000,000/- වන්දියක් ඉල්ලා නඩුවක් පවරා ඇත. තවමත් මෙම නඩුව මූලික අදියරේ පවතී.

9) අධ්‍යක්ෂක මණ්ඩල රැස්වීමේදී පහත සඳහන් යෝජනා සම්මත කර ඇත.
   (i) සාමාන්‍ය කොටස් සඳහා 15% ක අවසාන ලාභාංශයක් ගෙවීමට
   (ii) පොදු සංචිතයට රු. 200,000/- මාරු කිරීමට

ඉහත දී ඇති තොරතුරු උපයෝගීකරගෙන ප්‍රසිද්ධ කිරීම සඳහා සුදුසු ආකෘතිය අනුව 31/03/2008 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආදායම් වියදම් ප්‍රකාශය සහ ශේෂ පත්‍රය